ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
---------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව තහවුරු කල නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ආදායම් නොවන ලැබීම් රු. 14,832,776 ක් වුවත්, එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු. 364,494 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම රු. 14,468,282 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් නොවන ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව රැස් කරන ආදායම නිසා මෙම දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුලත්කර නොමැති බව සඳහන් කරමි. |

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාසික ගිණුම් සාරාංශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් නොවන ලැබීම් රු. 281,129,291 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 266,846,667 ක් ලෙස සටහන් කිරීම නිසා රු. 14,282,624 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මාසික ගිණුම් සාරාංශ අනුව ආදායම් නොවන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්නුම් කල යුතු වීම. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ආදායම් නොවන ලැබීම් රු. 266,846,667 ක් වූ අතර ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ රු. 5,066,556 ක ආදායම් ලැබීම් සටහන් කර ඇත. |

**1.6.3** රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය අතහැරගිය නිලධාරීන් 03 දෙනෙකුගේ එකතුව රු. 157,894 ක් වූ ආපදා හා උත්සව අත්තිකාරම් ණය ශේෂයන් වර්ෂ 02 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක වූ අතර, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව ශේෂ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නිලධාරීන් වෙත සේවය හැර යාමේ නිවේදනය නිකුත් කර ඇති අතර ණය මුදල් වහාම පියවීමට කටයුතු කරන ලෙස දන්වා ලිපි යොමු කර ඇතත් පිළිතුරු සපයා නැත. ප්‍රාදේශීය ලේකම් වෙතින් මෙම නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු විමසා ඇති බව දන්වමි. |

**1.6.4** ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් සඳහා වූ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 451 ප්‍රකාරව චෙක්පත්වලින් ලැබුණු මුදල් සටහන් කර ගැනීම පිණිස චෙක්පත් පිළිබඳ ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව චෙක්පත් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ලැබෙන චෙක්පත් , මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය ඉදිරියේදී නිසි පරිදි සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ)විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු සියලු විදුලි උපාංග හා උපකරණ පිළිබඳ ලේඛනයක් පිළියෙල කොට පවත්වාගෙන ගොස් නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව විදුලි උපාංග හා උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු වීම. | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය ඉදිරියේ දී නිසි පරිදි නඩත්තු කරන බව දන්වමි. |
| (ඇ)බැරකම් පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්‍ෂා කළ හැකි වන පරිදි බැරකම් පිළිබඳ ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | බැරකම් පිළිබඳ ලේඛනය සිගාස් වැඩසටහන යටතේ නඩත්තු කරන බව දන්වමි. |

**1.6.5** නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවන් පහත පරිදි දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 104(4) | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව හානියක් සිදු වූ දිනයේ සිට තුන්මසක් අතුළත පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ ජූලි හා ඔක්තෝම්බර් මාසවල අනතුරට ලක් වූ වාහන 02 ක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල කාලය තුල වාර්තා ඉදිරිපත් කල යුතු වීම. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභහානි සඳහා පූර්ණ වාර්තා වහාම ඉදිරිපත් කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්‍ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්‍ෂාවක් කළ යුතු වුවද, වාහන 23 කට අදාළ ඉන්ධන පරීක්‍ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂා කල යුතු වීම. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ඉන්ධන පරීක්‍ෂාව නොකළ බව හා ඉදිරියේදී එම පරීක්ෂණ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් සංකේත 20.02.01.03 යටතේ අන්තර් පළාත් ගොවිජනපද ප්‍රදේශයන්හි ඉඩම් බදු ආදායම් රැස් කිරීම් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 35,647,605 ක හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු ආදායම අදාල වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | බදුකරුවන් තෝරාගත් දිනයේ සිට බදුකරයක් නිකුත් කිරීම දක්වා කාලය වෙනුවෙන් අය කරන බදු මුදල් වාරික වශයෙන් ගෙවීමට අනුමැතිය ලබාදීම හා බදු මුදල් අඩු කිරීමට කරන ලද ඉල්ලීම් සඳහා තීරණ ලබාදීම ප්‍රමාද වීම. තවද බදුකරයක් නිකුත් නොකර භුක්තිය පැවරීමේ දී බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයන් මගින් හිඟ බදු අයකර ගැනීම බාධාවක් වීම. |
| (ආ) | අන්තර් පළාත් ගොවිජනපද ප්‍රදේශයන්හි හැර සෙසු ප්‍රදේශවල බදු ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර එම ප්‍රදේශවල රජයේ ඉඩම් පරිපාලනය හා පරිපාලනය සම්බන්ධ නිලධාරීන් අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ බලතල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබුණි. එසේ වුවද, බදු මුදල් අය කිරීමේ අධීක්ෂණ කටයුතු දුර්වල තත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 2,656.59 ක ආදායමක් අයකරගෙන නොතිබුණි. | රජයේ ඉඩම් ආඥා පනතේ 91 වගන්තිය, 2010 පෙබරවාරි 03 දිනැති එස් පී/ ආර් පී /02/10 දරන රාජ්‍ය ඉඩම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට හා අය වීමට ඇති හිඟ ආදායම් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු කළ යුතු | බදු දීමේ ක්‍රියාවලිය මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි ආයතන ගණනාවක් ඒකාබද්ධව සිදු කරන ක්‍රියාදාමයක් බැවින් සිදුවන ප්‍රමාදයන් නිසාත් කර්මාන්ත පුරවල හිඟ බදුකරුවන්ට ලබා දුන් සහන නිසාත් බදු අය කිරීමේ ගැටළු පැන නැඟී ඇති බව දක්වමි. එසේම ඉදිරියේ දී මාස 03 කට වරක් පළාත් සභා රැස්කරන බදු ආදායම් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට තීරණය කර ඇති බව දන්වමි. |

වීම.

2.2 වියදම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු. 46,500,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 23,821,261 ක මුදලක් ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 45 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | සැලසුම් කල පරිදි වැඩ සිදුකර ඇතත් අක් මුදල් නොලැබීම මත ගෙවීම් කිරීමට නොහැකි වීමෙන් බැරකම් වශයෙන් දක්වා ඇත. |

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා වියදමක් හෝ බැදීමක් ඇතිකර නොගත යුතු වුවත් වැය විෂයයන් 03 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.872,714 ක බැදීම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය තුල වියදම් කිරීමට කටයුතු කල යුතු වීම. | 2017 වර්ෂයේ අක් මුදල් නොලැබීම මත 2017 වර්ෂයේ ගෙවීම් කිරීමට නොහැකි වූ බැරකම් 2018 වර්ෂයේ ප්‍රතිපාදනවලින් නිරවුල් කිරීමට සිදු වීමෙන් වර්ෂයට අදාල කාර්යය ඉටු කිරීමේ අවශ්‍යතාවය මත බැරකම් ඇති වූ බව සඳහන් කරමි. |

2.4 තැන්පත් ශේෂයන්

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මිහිකත මැදුර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල රු. මිලියන 66.21 ක කොන්ත්‍රාත් රුඳවුම් මුදල් වර්ෂ 07 කට වැඩි කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | මිහිකත මැදුර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව රඳවාගත් මුදල්වලින් ගොඩනැගිල්ලේ ඇති වූ අළුත්වැඩියාවන් ඉටුකර ගැනීමට අවශ්‍ය ඇස්තමේන්තු, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එම අඩුපාඩු ඉදිරියේ දී සම්පූර්ණ කිරීමට නියමිතය. |

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 මෙහෙවර

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "ජාතික ප්‍රතිපත්තියක් තුළ මනා සම්බන්ධිකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායි බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට මග පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම" යන මෙහෙවර සාක්ෂාත් කරගැනීමට දෙපාර්තමේන්තුවේ කළමනාකරණයට අයත් ඉඩම් ප්‍රමාණය හා ඉන් බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ලේඛනයක් සකස් කර යාවත්කාලීන කිරීමට කටයුතු | මෙහෙවර තුළින් බලාපොරොත්තු වන අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | ලංකාවේ සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය මැනීම් කර නොමැති නිසා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කළමනාකරණය යටතේ තිබෙන ඉඩම් ප්‍රමාණය පැහැදිළිව හඳුනාගෙන නොමැතිබව හා අනවසර අල්ලා ගැනීම් සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පවත්වා ගෙන යන බව දන්වමි. |

නොකිරීම නිසා අනවසර පදිංචිකරුවන් හඳුනා ගැනීමට හා ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම
--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කර 2013 වර්ෂයේ සිට පවත්වාගෙන යන අතර ඒ සඳහා 2018 වර්ෂය දක්වා රු.මිලියන 115.71 ක වියදමක් දරා තිබුණි. එසේ වුවත් බදු දී ඇති සියළු ඉඩම් සම්බන්ධ තොරතුරු මෙතෙක් එම පද්ධතියට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් බදු අයකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මෙම පද්ධතියෙන් ලබා ගැනීමේ හැකියාවක් නොතිබුණි. | බදු දී ඇති රජයේ සියළු ඉඩම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි දත්ත ඇතුලත් කළ යුතු වීම. | 1931 වර්ෂයේ සිට රජයේ ඉඩම් බදු දීමට අදාල තොරතුරු රැස් කිරීම හා ද්විතියික දත්ත ඇතුලත් කිරීමට ක්ෂේත්‍රයට යායුතු බැවින් ඉදිරි වර්ෂ 05 ක කාලයක් තුල පැරණි තොරතුරු ඇතුලත් කිරීමට සැලසුම් කර ඇත. |

3.3 වත්කම් කළමනාකරණය
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 7.5 ක් වටිනා මෝටර් වාහනයක් වසර 2 කට වැඩි කාලයක සිට නීත්‍යානුකූලව පැවරීමකින් තොරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ භාවිතයට ලබාදී තිබුණි. | වාහනය කඩිනමින් නැවත ලබා ගැනීම සඳහා කටයුතු කල යුතු වීම. | නීත්‍යානුකූලව එම අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් රු.මිලියන 7.12 ක් වටිනා එක් වාහනයක් වර්ෂ 04 කට අධික කාලයක සිටද ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයත් රු.මිලියන 11.4 ක් වටිනා වාහන 02 ක් වර්ෂ 10 කට අධික කාලයක සිටද රු. මිලියන | වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම වාහන සියල්ල දෙපාර්තමේන්තුව වෙත නීත්‍යානුකූලව පවරා දීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් |

| | | | |
|---|---|---|---|
| | 48.54 ක් වටිනා වාහන 7 ක් වර්ෂ 4 කට අධික කාලයක සිටද දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණු නමුත් එම වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබී ඇති අතර එම වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------------ | ----------------- |
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් භූමියක රු. මිලියන 36.40 ක වියදමක් දරමින් ඉදිකරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල් නිල නිවස, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාවේ සහ පරිසර අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ඉදිකිරීම හේතුවෙන් වර්ෂ 02 කට වැඩි කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි. | ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට හා ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ලවා භූමිය සකසා භාවිතයට ගැනීමට කටයුතු කරන බව හා ඉඩමේ නිරවුල් හිමිකාරත්වය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පර්චස් 29.88 ක රජයේ ඉඩමක් දීර්ඝකාලීන බදු පදනම යටතේ සීමා සහිත ස්වාධීන රූපවාහිනී සේවය වෙත ලබා දී තිබුණද ගෙවියයුතු බදු මුදල දැනුම් දීමට භුක්තිය භාරදුන් දිනයේ සිට වර්ෂ 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණු අතර භුක්තිය බාරදුන් දිනයේ සිට වර්ෂ 10 ක කාලයක් කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවීමට ඇති හිඟ බදු මුදල රු. 14,725,384 කි. එසේ වුවද ඉඩම් බදු දීමේ දී නීත්‍යානුකූලභාවය ආරක්ෂා වන පරිදි බදුකරයක් නිකුත් කර නොතිබීම හේතුවෙන් බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් බදුකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග වලට එළඹීමේ හැකියාවක් නොතිබුණි. | ඉඩම්වල භුක්තිය භාර දුන් වහාම ගෙවිය යුතු බදු මුදල බදුකරු වෙත දැනුම් දිය යුතු වන අතර අප්‍රමාදව අදාල බදුකරු සමඟ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීම තුළින් හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | බදු දීමේ ක්‍රියාවලියේදී ආයතන කිහිපයක් සම්බන්ධවන බැවින් සැලකිය යුතු කාලයක් ගතවන බව හා බදු ගෙවීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් බදු ගැනුම්කාර ආයතනය සමග සාකච්ඡා කල බව හා ඉදිරියේදී බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 1.163 ( පර්චස් 416 ) ක රජයේ ඉඩමක් දීර්ඝකාලීන බදු පදනම යටතේ 1956 වර්ෂයේ සිට වර්ෂ 30ක කාලයක් සඳහා ක්‍රීඩා සමාජයක් වෙත ලබා දී තිබුණු අතර ඉන් පසුව වර්ෂ 17 ක කාලයක් බදු ගිවිසුමකින් සහ බදු මුදල් ගෙවීමකින් තොරව අදාල ඉඩම භුක්තිවිඳ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 34,061,250 ක බදු මුදල් හිඟව පැවතුනද නීත්‍යානුකූලභාවය ආරක්ෂා වන පරිදි බදුකරයක් නිකුත් කර නොතිබීම හේතුවෙන් බදු මුදල් ගෙවීම පැහැරහැරීම සම්බන්ධයෙන් බදුකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග වලට එළඹීමේ හැකියාවක් නොතිබුණි. | බදු දෙන ඉඩම් සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් නඩත්තු කරමින් බදු කාලය අවසන් වූ වහාම කාලය දීර්ඝකල යුතු වන අතර නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීම තුළින් බදු මුදල් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | බදු කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීම බදුකරුගේ වගකීමක් වන බව සහ බදු ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම සඳහා අදාල බදු නිර්දේශ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් ඉදිරිපත් කර ඇත්තේ ප්‍රමාද වී බව දන්වන අතර බදුකාර ආයතනය සමග සාකච්ඡා කිරීමෙන් පසු 2019 වර්ෂය අවසන් වීමට පෙර සම්පූර්ණ හිඟ බදු මුදල ගෙවීමට එකඟ වී ඇති බව දන්වමි. |

4. මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ තනතුරුවල පුරප්පාඩු 329 ක් පැවති අතර, ඒ තුල ඉඩම් කොමසාරිස් තනතුරු 06 ක් ජනපද නිලධාරී තනතුරු 115 ක් හා සංවර්ධන සහකාර තනතුරු 06 ක් පැවතුණි. එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට බාධා වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් සම්පූර්ණ කළ යුතු වීම. | ඉදිරියේදී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |